# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2021/29 - 2017 මැයි මස 31 වැනි බදාදා - 2017.05.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 19/78

**1978 අංක 2 දරණ අධිකරණ සංවිධාන පනත**

3 වන වගන්තිය යටතේ නියමය

1978 අංක 2 දරණ අධිකරණ සංවිධාන පනතේ 3 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ වන මා විසින්, අග්‍රවිනිශ්චයකාරයා සහ අභියාචනා අධිකරණයේ සභාපතිවරයා විමසා, මේ නියමය මගින් 2014 නොවැම්බර් මස 26 දින අංක 1890/17 දරණ *අති විශෙෂ ගැසට් පත්‍රය* මඟින් අවසන් වරට සංශෝධිත 2010 නොවැම්බර් 10 වන දිනැති අංක 1679/40 දරණ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නියමයේ උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) ''අධිකරණ කලාප තිස් තුනකින්'' යන වචන වෙනුවට ''අධිකරණ කලාප තිස් හතරකින්'' යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එහි උපලේඛනයේ :-

(i) ''කලාපය'' යන ශීර්ෂය යටතේ I වන තීරුවේ සඳහන් ''අවිස්සාවේල්ල'' යන සටහන සහ ඊට අනුරූපීව IV වන තීරුවේ ''අධිකරණ බල ප්‍රදේශය'' යන ශීර්ෂය යටතේ වූ සටහන වෙනුවට පිළිවෙලින් පහත දැක්වෙන සටහන් ආදේශ කිරීමෙන් :-

| | |
|---|---|
| ''11. අවිස්සාවේල්ල | අවිස්සාවේල්ල අධිකරණ කලාපය, අවිස්සාවේල්ල, සහ රුවන්වැල්ල යන අධිකරණ දිසාවලින් සංයුක්ත වේ.'' ; |

(ii) I වන තීරුව යටතේ අවිස්සාවේල්ල අධිකරණ කලාපයට අනුරූපීව, II, III සහ IV වන තීරුවල සඳහන් ''හෝමාගම'' අධිකරණ දිසාවට, ''හෝමාගම'' අධිකරණ කොට්ඨාසයට සහ අධිකරණ බල ප්‍රදේශයට අදාළ සියලු සටහන් ඉවත් කිරීමෙන් ;

(iii) ''කලාපය'' යන ශීර්ෂය යටතේ I වන තීරුවේ සඳහන් ''පානදුර'' යන සටහන සහ ඊට අනුරූපීව IV වන තීරුවේ ''අධිකරණ බල ප්‍රදේශය'' යන ශීර්ෂය යටතේ වූ සටහන වෙනුවට පිළිවෙලින් පහත දැක්වෙන සටහන් ආදේශ කිරීමෙන් :-

''4. පානදුර — පානදුර අධිකරණ කලාපය, පානදුර, හොරණ සහ මොරටුව යන අධිකරණ දිසාවලින් සංයුක්ත වේ.'';

(iv) I වන තීරුව යටතේ පානදුර අධිකරණ කලාපයට අනුරූපීව, II, III සහ IV වන තීරුවල සඳහන් ''කැස්බෑව'' අධිකරණ දිසාවට, කැස්බෑව අධිකරණ කොට්ඨාසයට සහ අධිකරණ බල ප්‍රදේශයට අදාළ සියලු සටහන් ඉවත් කිරීමෙන් ;

(v) පානදුර අධිකරණ කලාපයට අනුරූපීව, II තීරුව යටතේ වූ ''දිසාව'' යන ශීර්ෂය යටතේ සඳහන් වන ''3. හොරණ'' සහ ''4. මොරටුව'' යන සටහන් පිළිවෙලින් ''2. හොරණ'' සහ ''3. මොරටුව'' යනුවෙන් නැවත අංක යෙදීමෙන් ;

(vi) ''කලාපය'' යන ශීර්ෂය යටතේ I වන තීරුවේ සඳහන් ''කොළඹ'' යන සටහන සහ ඊට අනුරූපීව IV වන තීරුවේ ''අධිකරණ බල ප්‍රදේශය'' යන ශීර්ෂය යටතේ වූ සටහන වෙනුවට පිළිවෙලින් පහත දැක්වෙන සටහන් ආදේශ කිරීමෙන් :-

''1. කොළඹ — කොළඹ අධිකරණ කලාපය, කොළඹ සහ ගල්කිස්ස යන අධිකරණ දිසාවලින් සංයුක්ත වේ.'';

(vii) I වන තීරුව යටතේ කොළඹ අධිකරණ කලාපයට අනුරූපීව, II, III සහ IV වන තීරුවල සඳහන් ''කඩුවෙල'' අධිකරණ දිසාවට කඩුවෙල අධිකරණ කොට්ඨාසයට සහ අධිකරණ බල ප්‍රදේශයට අදාළ සියලු සටහන් ඉවත් කිරීමෙන් ;

(viii) ''කලාපය'' සහ ශීර්ෂය යටතේ I වන තීරුවේ සඳහන් ''33. කිලිනොච්චි'' යන සටහන සහ ඊට අනුරූපී පිළිවෙලින් II වන, III වන සහ IV වන තීරයන්හි සඳහන් සටහන්වලට ඉක්බිතිව පහත අළුත් අංක 34 සටහන ඇතුලත් කිරීමෙන් ;

''34. හෝමාගම — හෝමාගම අධිකරණ කලාපය, හෝමාගම, කැස්බෑව සහ කඩුවෙල යන අධිකරණ දිසාවලින් සංයුක්ත වේ.'';

''1. හෝමාගම — හෝමාගම අධිකරණ දිසාව හෝමාගම අධිකරණ කොට්ඨාසයෙන් සංයුක්ත වේ.

1. හෝමාගම — හෝමාගම අධිකරණ කොට්ඨාසය, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි ජල්තර (ග්‍රා. නි. කො. අංක 449), හේන්පිට (ග්‍රා. නි. කො. අංක 451), ආටිගල බටහිර (ග්‍රා. නි. කො. අංක 446ඒ), ආටිගල නැගෙනහිර (ග්‍රා. නි. කො. අංක 446), බටවල (ග්‍රා. නි. කො. අංක 450), වල්පිට (ග්‍රා. නි. කො. අංක 450ඒ), නාවලමුල්ල (ග්‍රා. නි. කො. අංක 482ඩී), මීගස්මුල්ල (ග්‍රා. නි. කො. අංක 482ඊ), හබරකඩ උතුර (ග්‍රා. නි. කො. අංක 481), මුල්ලේගම උතුර (ග්‍රා. නි. කො. අංක 481ඩී), මුල්ලේගම දකුණ (ග්‍රා. නි. කො. අංක 481ඒ), හබරකඩ දකුණ (ග්‍රා. නි. කො. අංක 481බී), පනාගොඩ නගරය (ග්‍රා. නි. කො. අංක 482බී), හේනවත්ත (ග්‍රා. නි. කො. අංක 482සී), මීගොඩ උතුර (ග්‍රා. නි. කො. අංක 447), පනාලුව (ග්‍රා. නි. කො. අංක 447බී), වටරැක උතුර (ග්‍රා. නි. කො. අංක 448බී), මීගොඩ දකුණ (ග්‍රා. නි. කො. අංක 447ඒ), ගොඩගම උතුර (ග්‍රා. නි. කො. අංක 483), පනාගොඩ බටහිර (ග්‍රා. නි. කො. අංක 482), පනාගොඩ නැගෙනහිර (ග්‍රා. නි. කො. අංක 482ඒ),

හබරකඩ වත්ත (ග්‍රා. නි. කො. අංක 481සී), හෝමාගම උතුර (ග්‍රා. නි. කො. අංක 486), හෝමාගම බටහිර (ග්‍රා. නි. කො. අංක 486බී), හෝමාගම දකුණ (ග්‍රා. නි. කො. අංක 486එෆ්), ගලවිලවත්ත උතුර (ග්‍රා. නි. කො. අංක 486සී), හෝමාගම නගරය (ග්‍රා. නි. කො. අංක 486ඒ), හෝමාගම නැගෙනහිර (ග්‍රා. නි. කො. අංක 486ඩී), පිටිපන නගරය (ග්‍රා. නි. කො. අංක 484බී), ගොඩගම දකුණ (ග්‍රා. නි. කො. අංක 483ඒ), කුරුඳුවත්ත (ග්‍රා. නි. කො. අංක 448සී), ගෙහෙනුවල (ග්‍රා. නි. කො. අංක 447සී), වටරැක දකුණ (ග්‍රා. නි. කො. අංක 448), ඕවිටිගම (ග්‍රා. නි. කො. අංක 448ඒ), කන්දවත්ත (ග්‍රා. නි. කො. අංක 484ඩී), කිරිබේරියකැලේ (ග්‍රා. නි. කො. අංක 484එෆ්), මාවත්ගම (ග්‍රා. නි. කො. අංක 485), කටුවාන (ග්‍රා. නි. කො. අංක 486ඊ), ගලවිලවත්ත දකුණ (ග්‍රා. නි. කො. අංක 486ජී), නියදගල (ග්‍රා. නි. කො. අංක 499ඒ), හිරිපිටිය (ග්‍රා. නි. කො. අංක 499ජී), මාඹුල්ගොඩ (ග්‍රා. නි. කො. අංක 500ඒ), බ්‍රාහ්මනගම (ග්‍රා. නි. කො. අංක 500), උඩුවන (ග්‍රා. නි. කො. අංක 485ඒ), ප්‍රසන්නපුර (ග්‍රා. නි. කො. අංක 484ජී), පිටිපන උතුර (ග්‍රා. නි. කො. අංක 484), සුවපුබුදුගම (ග්‍රා. නි. කො. අංක 484ඊ), පිටිපන දකුණ (ග්‍රා. නි. කො. අංක 484ඒ), සහ දොලහේන (ග්‍රා. නි. කො. අංක 484සී), යන ග්‍රාම නිලධාරී කොට්ඨාස වලින් සංයුක්ත වේ.

මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි කොට්ටාව නැගෙනහිර (ග්‍රා. නි. කො. අංක 496ඒ), රුක්මලේ බටහිර (ග්‍රා. නි. කො. අංක 497), රුක්මලේ නැගෙනහිර ඒ (ග්‍රා. නි. කො. අංක 497ඒ), රුක්මලේ නැගෙනහිර බී (ග්‍රා. නි. කො. අංක 497බී), ලියනගොඩ (ග්‍රා. නි. කො. අංක 496ඊ), කොට්ටාව උතුර (ග්‍රා. නි. කො. අංක 496සී), කොට්ටාව බටහිර (ග්‍රා. නි. කො. අංක 496ඩී), කොට්ටාව දකුණ (ග්‍රා. නි. කො. අංක 496), මාලපල්ල බටහිර (ග්‍රා. නි. කො. අංක 498බී), මාලපල්ල නැගෙනහිර (ග්‍රා. නි. කො. අංක 498), මාකුඹුර උතුර (ග්‍රා. නි. කො. අංක 498ඒ), මාකුඹුර දකුණ (ග්‍රා. නි. කො. අංක 498සී), සහ කොට්ටාව නගරය (ග්‍රා. නි. කො. අංක 496බී) යන ග්‍රාම නිලධාරී කොට්ඨාස වලින් සංයුක්ත වේ.

පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි හොරකන්දවල (ග්‍රා. නි. කො. අංක 464සී), දම්පේ (ග්‍රා. නි. කො. අංක 464ඒ), බේරුකැටිය (ග්‍රා. නි. කො. අංක 464ඩී), හොරගල බටහිර (ග්‍රා. නි. කො. අංක 464බී), හොරගල නැගෙනහිර (ග්‍රා. නි. කො. අංක 464), මාදුලාව දකුණ (ග්‍රා. නි. කො. අංක 463ඒ), මාදුලාව උතුර (ග්‍රා. නි. කො. අංක 463), පෝරේගෙදර (ග්‍රා. නි. කො. අංක 462ඒ), පහල පාදුක්ක (ග්‍රා. නි. කො. අංක 461සී), ලියන්වල (ග්‍රා. නි. කො. අංක 462), කුරුගල (ග්‍රා. නි. කො. අංක 465), පාදුක්ක (ග්‍රා. නි. කො. අංක 461), උඩුමුල්ල (ග්‍රා. නි. කො. අංක 461බී), ගලගෙදර නැගෙනහිර (ග්‍රා. නි. කො. අංක 452), ගලගෙදර උතුර (ග්‍රා. නි. කො. අංක 452ඒ), සහ ගලගෙදර දකුණ (ග්‍රා. නි. කො. අංක 452බී) යන ග්‍රාම නිලධාරී කොට්ඨාස වලින් සංයුක්ත වේ.

2. කැස්බෑව — කැස්බෑව අධිකරණ දිසාව කැස්බෑව අධිකරණ කොට්ඨාසයෙන් සංයුක්ත වේ.

1. කැස්බෑව — කැස්බෑව අධිකරණ කොට්ඨාසය, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි, විශ්වකලාව (ග්‍රා. නි. කො. අංක 574බී), නිවන්තිඩිය (ග්‍රා. නි. කො. අංක 580ඒ), පැලැන්වත්ත නැගෙනහිර (ග්‍රා. නි. කො. අංක 582බී), පැලැන්වත්ත උතුර (ග්‍රා. නි. කො. අංක 582), පැලැන්වත්ත බටහිර (ග්‍රා. නි. කො. අංක 582ඒ), පාලිගෙදර (ග්‍රා. නි. කො. අංක 583ඒ), කාලියම්මහර (ග්‍රා. නි. කො. අංක 580), බෝකුන්දර (ග්‍රා. නි. කො. අංක 575), තුම්බෝවිල දකුණ (ග්‍රා. නි. කො. අංක 576බී), තුම්බෝවිල උතුර (ග්‍රා. නි. කො. අංක 576ඒ), වෑවල බටහිර (ග්‍රා. නි. කො. අංක 562බී), වෑවල නැගෙනහිර (ග්‍රා. නි. කො. අංක 562), තුම්බෝවිල බටහිර

(ග්‍රා. නි. කො. අංක 576), මාම්පෙ උතුර (ග්‍රා. නි. කො. අංක 574ඒ), මකුලුදූව (ග්‍රා. නි. කො. අංක 583), ගොරකපිටිය (ග්‍රා. නි. කො. අංක 584), නම්පමුණුව (ග්‍රා. නි. කො. අංක 584ඒ), මාවිත්තර උතුර (ග්‍රා. නි. කො. අංක 586ඒ), මාම්පෙ නැගෙනහිර (ග්‍රා. නි. කො. අංක 574ඩී), මාම්පෙ බටහිර (ග්‍රා. නි. කො. අංක 574), මාම්පෙ දකුණ (ග්‍රා. නි. කො. අංක 574සී), කොලමුන්න (ග්‍රා. නි. කො. අංක 563/7), සුවාරපොල නැගෙනහිර (ග්‍රා. නි. කො. අංක 562ඒ), සුවාරපොල බටහිර (ග්‍රා. නි. කො. අංක 562සී), හැඩිගම (ග්‍රා. නි. කො. අංක 563/7), බටකැත්ත උතුර (ග්‍රා. නි. කො. අංක 565), කැස්බෑව උතුර (ග්‍රා. නි. කො. අංක 572), කැස්බෑව නැගෙනහිර (ග්‍රා. නි. කො. අංක 572බී), මාවිත්තර දකුණ (ග්‍රා. නි. කො. අංක 586), හොන්නත්තර උතුර (ග්‍රා. නි. කො. අංක 585), හොන්නත්තර දකුණ (ග්‍රා. නි. කො. අංක 585ඒ), මාකන්දර නැගෙනහිර (ග්‍රා. නි. කො. අංක 569), කැස්බෑව දකුණ (ග්‍රා. නි. කො. අංක 572ඒ), බටකැත්තර දකුණ (ග්‍රා. නි. කො. අංක 565ඒ), මඩපාත (ග්‍රා. නි. කො. අංක 567), දූල්තර බටහිර (ග්‍රා. නි. කො. අංක 564), දූල්තර නැගෙනහිර (ග්‍රා. නි. කො. අංක 564ඒ), දාම්පෙ (ග්‍රා. නි. කො. අංක 566), මාකන්දන බටහිර (ග්‍රා. නි. කො. අංක 569ඒ), නිවුන්ගම (ග්‍රා. නි. කො. අංක 568ඒ), හල්පිට (ග්‍රා. නි. කො. අංක 570/5), හොරේතුඩුව (ග්‍රා. නි. කො. අංක 570/7), මොරැන්ද (ග්‍රා. නි. කො. අංක 568), බටුවන්දර උතුර (ග්‍රා. නි. කො. අංක 596), බටුවන්දර දකුණ (ග්‍රා. නි. කො. අංක 596), ජඹුරලිය (ග්‍රා. නි. කො. අංක 597), පොල්හේන (ග්‍රා. නි. කො. අංක 598බී), රෙජිදෙල් වත්ත (ග්‍රා. නි. කො. අංක 598ඒ) සහ කහපොල (ග්‍රා. නි. කො. අංක 598) යන ග්‍රාම නිලධාරී කොට්ඨාසවලින් සංයුක්ත වේ.

හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි, කිතුල්හේන (ග්‍රා. නි. කො. අංක 591සී), සිද්දමුල්ල උතුර (ග්‍රා. නි. කො. අංක 591), සිද්දමුල්ල දකුණ (ග්‍රා. නි. කො. අංක 591බී), මත්තේගොඩ බටහිර (ග්‍රා. නි. කො. අංක 587), මත්තේගොඩ මධ්‍යම 'ඒ' (ග්‍රා. නි. කො. අංක 587ඒ), මත්තේගොඩ නැගෙනහිර (ග්‍රා. නි. කො. අංක 587සී), දීපන්ගොඩ (ග්‍රා. නි. කො. අංක 590බී), මාගම්මන බටහිර (ග්‍රා. නි. කො. අංක 590ඒ), මාගම්මන නැගෙනහිර (ග්‍රා. නි. කො. අංක 590), දියගම නැගෙනහිර (ග්‍රා. නි. කො. අංක 589), දියගම බටහිර (ග්‍රා. නි. කො. අංක 589ඒ), කිරිගම්පමුණුව (ග්‍රා. නි. කො. අංක 588), මත්තෙගොඩ මධ්‍යම බී (ග්‍රා. නි. කො. අංක 587බී), සියඹලාගොඩ උතුර (ග්‍රා. නි. කො. අංක 592), කුඩාගමුව (ග්‍රා. නි. කො. අංක 591ඒ), සංඝාරාම (ග්‍රා. නි. කො. අංක 591ඩී), සියඹලාගොඩ දකුණ (ග්‍රා. නි. කො. අංක 592ඒ), රිලාවල (ග්‍රා. නි. කො. අංක 593ඒ), කහතුඩුව බටහිර (ග්‍රා. නි. කො. අංක 602බී), කිරිවත්තුඩුව දකුණ (ග්‍රා. නි. කො. අංක 603ඒ), කිරිවත්තුඩුව උතුර (ග්‍රා. නි. කො. අංක 603), මූණමලෙයකහලුව (ග්‍රා. නි. කො. අංක 603සී), කිතුලාවිල (ග්‍රා. නි. කො. අංක 603බී), කහතුඩුව උතුර (ග්‍රා. නි. කො. අංක 602), කහතුඩුව නැගෙනහිර (ග්‍රා. නි. කො. අංක 602සී), කහතුඩුව දකුණ (ග්‍රා. නි. කො. අංක 602ඒ), උඳුරුගොඩ (ග්‍රා. නි. කො. අංක 600), වැතර (ග්‍රා. නි. කො. අංක 593), අම්බලන්ගොඩ (ග්‍රා. නි. කො. අංක 594), හෙරලියවල (ග්‍රා. නි. කො. අංක 595), පලාගම (ග්‍රා. නි. කො. අංක 599), වෙනිවැල්කොල (ග්‍රා. නි. කො. අංක 601), යන ග්‍රාම නිලධාරී කොට්ඨාසවලින් යුක්ත වේ.

3. කඩුවෙල — කඩුවෙල අධිකරණ දිසාව, කඩුවෙල අධිකරණ කොට්ඨාසයෙන් සංයුක්ත වේ.

1. කඩුවෙල — කඩුවෙල අධිකරණ කෙට්ඨාසය, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි වැලිවිට (ග්‍රා. නි. කො. අංක 475), රග්ගහවත්ත (ග්‍රා. නි. කො. අංක 474ඒ), හේවාගම (ග්‍රා. නි. කො. අංක 474), කඩුවෙල (ග්‍රා. නි. කො. අංක 473ඒ), පහළ බෝමිරිය (ග්‍රා. නි. කො. අංක 472ඒ), ඉහළ බෝමිරිය (ග්‍රා. නි. කො. අංක 471), වෙක්වත්ත (ග්‍රා. නි. කො. අංක 471ඒ), නවගමුව (ග්‍රා. නි. කො. අංක 470), පහළ බෝමිරිය B (ග්‍රා. නි. කො. අංක 472බී), වැලිහිඳ (ග්‍රා. නි. කො. අංක 488ඒ), කොතලාවල (ග්‍රා. නි. කො. අංක 473), මහදෙනිය (ග්‍රා. නි. කො. අංක 475ඒ),

තලාහේන උතුර (ග්‍රා. නි. කො. අංක 478), මාලඹේ උතුර (ග්‍රා. නි. කො. අංක 476බී), තුන්දහේන (ග්‍රා. නි. කො. අංක 488බී), කොරතොට (ග්‍රා. නි. කො. අංක 488), නවගමුව දකුණ (ග්‍රා. නි. කො. අංක 470ඒ), බටේවෙල (ග්‍රා. නි. කො. අංක 480සී), රණාල (ග්‍රා. නි. කො. අංක 469), දැඩිගමුව (ග්‍රා. නි. කො. අංක 480ඒ), ඇඹිල්ලදෙනිය (ග්‍රා. නි. කො. අංක 480ඩී), වැලිපිල්ලෑව (ග්‍රා. නි. කො. අංක 480), ශාන්තාලෝකගම (ග්‍රා. නි. කො. අංක 487ඒ), පෝරේ (ග්‍රා. නි. කො. අංක 489), මාලඹේ නැගෙනහිර (ග්‍රා. නි. කො. අංක 476), මාලඹේ බටහිර (ග්‍රා. නි. කො. අංක 476ඒ), තලංගම උතුර B (ග්‍රා. නි. කො. අංක 477ඒ), තලාහේන දකුණ (ග්‍රා. නි. කො. අංක 478ඒ), මුත්තෙට්ටුගොඩ (ග්‍රා. නි. කො. අංක 477බී), තලංගම උතුර A (ග්‍රා. නි. කො. අංක 477), සුභූතිපුර (ග්‍රා. නි. කො. අංක 492), උඩුමුල්ල (ග්‍රා. නි. කො. අංක 492සී), බත්තරමුල්ල උතුර (ග්‍රා. නි. කො. අංක 492බී), බටපොත (ග්‍රා. නි. කො. අංක 479ඊ), පොතුඅරාව (ග්‍රා. නි. කො. අංක 477සී), හෝකන්දර උතුර (ග්‍රා. නි. කො. අංක 494), ඔරුවල (ග්‍රා. නි. කො. අංක 487), අතුරුගිරිය (ග්‍රා. නි. කො. අංක 490), තල්දියවල (ග්‍රා. නි. කො. අංක 490බී), බොරළුගොඩ (ග්‍රා. නි. කො. අංක 489ඒ), හෝකන්දර නැගෙනහිර (ග්‍රා. නි. කො. අංක 494ඒ), අරන්ගල (ග්‍රා. නි. කො. අංක 494බී), ඇවරිහේන (ග්‍රා. නි. කො. අංක 495ඒ), කුමාරගෙවත්ත (ග්‍රා. නි. කො. අංක 479ඩී), ජයවඩනගම (ග්‍රා. නි. කො. අංක 479), අරුප්පිටිය (ග්‍රා. නි. කො. අංක 479ඊ), ආසිරි උයන (ග්‍රා. නි. කො. අංක 479බී), බත්තරමුල්ල දකුණ (ග්‍රා. නි. කො. අංක 492ඒ), රජමල්වත්ත (ග්‍රා. නි. කො. අංක 492ඩී), පහළවෙල (ග්‍රා. නි. කො. අංක 479ඒ), වික්‍රමසිංහපුර (ග්‍රා. නි. කො. අංක 479සී), වෙල්ලන්ගිරිය (ග්‍රා. නි. කො. අංක 495), හෝකන්දර දකුණ (ග්‍රා. නි. කො. අංක 494සී), අතුරුගිරිය දකුණ (ග්‍රා. නි. කො. අංක 490ඒ) යන ග්‍රාම නිලධාරී කොට්ඨාසවලින් සංයුක්ත වේ.

මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි තලවතුගොඩ බටහිර (ග්‍රා. නි. කො. අංක 493ඒ), තලවතුගොඩ නැගෙනහිර (ග්‍රා. නි. කො. අංක 493බී), සහ කලල්ගොඩ (ග්‍රා. නි. කො. අංක 493), යන ග්‍රාම නිලධාරී කොට්ඨාසවලින් සංයුක්ත වේ.

විජයදාස රාජපක්ෂ,
අධිකරණ අමාත්‍ය.

2017 ජනවාරි මස 18 වැනි දින,

6-489

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.